www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 06 | |
| විෂයය / பாடம் / Subject | පුරවැසි අධ්‍යාපනය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | |
| කාලය / காலம் / Time | පැය 02යි. | |

නම :-........................................ විභාග අංකය:-........................................

සැලකිය යුතුයි.
- I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසට අමුණා භාර දෙන්න.

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට උපකාරවන මූලාශ්‍රය අයත් පිළිතුර කුමක් ද?
   1. පාසල් සිසු සිසුවියන්ගේ වයස් සීමා.
   2. පාසල් සංවිධාන ව්‍යුහය.
   3. පාසලේ විවිධ ස්ථානවල සවිකර ඇති සමරු ඵලක.
   4. පාසලේ තිබෙන ගොඩනැගිලි සංඛ්‍යාව.

02. A. හොඳින් ඉගනීමේ කටයුතුවල යෙදීම.
   B. පාසල් පාදක ඇගයීම් සිදු කරවීම.
   C. විෂයට අදාළ දැනුම, කුසලතා වර්ධනය කරවීම.
   D. පාසලේ ගෞරවය ආරක්ෂාවන පරිදි සැම විට හැසිරීම.

   ඉහත ප්‍රකාශවලින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවකගේ යුතුකම් හා වගකීම් ඇතුළත් පිළිතුර වනුයේ,
   1. A හා D ය.
   2. B හා C ය.
   3. C හා D ය.
   4. A හා C ය.

03. පුද්ගලයකු සතු දුර්වලතා පිළිබඳ ගතහැකි හොඳම ක්‍රියා මාර්ගය වන්නේ,
   1. තම දුර්වලතා අන්අය පෙන්වා දුන්විට ඒ අයට බැන වැදීම ය.
   2. හැකිතාක් දුර්වලතා අවම කර ගැනීමට අධිෂ්ඨානයක් ඇතිකර ගැනීම ය.
   3. තම දුර්වලතා නොසලකා හැර කටයුතු කිරීම ය.
   4. තමන්ට කිසිදු දුර්වලතාවක් නොමැති බව ප්‍රකාශ කිරීම ය.

04. ඖෂධවේදය පිළිබඳ ප්‍රථම මහාචාර්ය සේනක බිබිලේ මහතා සම්බන්ධ ප්‍රකාශය තෝරන්න.
   1. බලපිටිය අම්බන්ගොඩ අතර පිහිටි රන්දොඹේ ගම්මානයේ උපත ලැබීම.
   2. 1910 දී නීති වෘත්තියට පිවිස පසුව දේශපාලන කටයුතුවල යෙදීම.
   3. දරුවන්ට මව් භාෂාවෙන් අධ්‍යාපනය ලබාදීම හා මධ්‍ය විද්‍යාල පිහිටුවීම.
   4. රෝගීන්ට අත්‍යවශ්‍ය බෙහෙත් සහන මිලට ලබා දීමට කටයුතු කිරීම.

05. සැළසුමකට අනුව කටයුතු කරන පාසල් සිසුවකු/ සිසුවියක විසින් ගත හැකි ක්‍රියා මාර්ගය ඇතුළත් පිළිතුර තෝරන්න.
   1. වේලාසනින් නින්දට යාම හා උදෑසනින් අවදිවීම.
   2. පැවරුම් හා ගෙදර වැඩ මඟ හැරීම.
   3. පාසල් නිල ඇඳුම් හා උපකරණ පාසල් යාමට ආසන්නයේ සොයා ගැනීම.
   4. පවතින අඩුපාඩු ගැන නොසලකා හැරීම.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

- අංක 6 සිට 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. පාසලේ ආදර්ශ පාඨය පාසල් සිසුන්ගේ ජීවිතය හැඩගස්වා ගැනීමට ආදර්ශයක් වන අයුරින් සකස්කර තිබේ. ( )

07. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිපයක් එක් වීමෙන් පළාතක් නිර්මාණය වේ. ( )

08. මිනිසාගේ බුද්ධිමය හා කායික හැකියා වැඩි දියුණු කර ගැනීමෙන්, මානව සම්පතක් බවට පත්කර ගත හැකිය. ( )

09. නගර සභාවක ප්‍රධානියා නගරාධිපති ලෙස හැඳින් වේ. ( )

10. ඔබ ප්‍රදේශයේ තිබෙන සමිතිවල නිලධාරීන් ප්‍රදේශයේ ජනතා අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා කටයුතු කරති. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වරහන තුළ දී ඇති පිළිතුර සහිත වචනවලින් නිවැරදි පිළිතුර සහිත වචනය හිස්තැන මත ලියන්න.

(පරිපාලන, භෞතික, සාමූහිකව, මානව, යුතුකම, අරපිරිමැස්මෙන්, කුඩාම)

11. මිනිසාගේ පැවැත්මට අත්‍යවශ්‍ය .............................................. සම්පත් පණමෙන් රැකගත යුතුය.

12. ශ්‍රී ලංකාව .............................................. දිස්ත්‍රික්ක 25කට බෙදා තිබේ.

13. ඔබ ජීවත්වන ප්‍රදේශයේ මිනිසුන් සමග .............................................. කටයුතු කිරීමෙන් සුහදත්වය හා සමගිය ඇති වේ.

14. පොදු සේවා පරිහරන කරන සැමදෙනාම ඒවා .............................................. පරිහරණය කිරීම ඔවුන් සතු යුතුකමකි.

15. අපේ රටේ පරිපාලන බෙදීම් අනුව .............................................. පරිපාලන ඒකකය ග්‍රාම නිලධාරී කොට්ඨාසය වේ.

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා X කොටසේ ප්‍රකාශයට වඩාත් නිවැරදි පිළිතුර Y කොටසින් තෝරා අදාළ අක්ෂරය වරහන තුළ යොදන්න.

| X කොටස | | Y කොටස |
|---|---|---|
| 16. මාතෘ භූමියේ සම්පත් හා දේපල සුරකිමින් දේශයේ අභිමානය රැකගැනීම. | ( ) | A සක්‍රියව සවන් දීම නිසා ඇති වේ. |
| 17. කෙනෙකු දෙනු ලබන පණිවිඩ නිවැරදි ලෙස අවබෝධ කර ගැනීම. | ( ) | B සම්පත් ලෙස හැඳින්විය හැකිය |
| 18. ස්වභාව ධර්මයෙන් අපට ලැබී ඇති දායාද | ( ) | C යහපත් පුරවැසි වගකීමක් වේ. |
| 19. සියලු පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගතහැකි සේවා ස්ථාන හා ඒවාට අයත් භාණ්ඩ | ( ) | D සම්ප්‍රදායයන් වේ. |
| 20. පාසලේ කාලයක් තිස්සේ පැවත එන සිරිත් විරිත් පිළිගැනීම් ආදිය | ( ) | E පොදු දේපළ වේ. |
| | | F නීති රීති වේ. |

(ලකුණු 2 x 20 = 40)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

## II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. (i) ඔබ සතු යහපත් ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ඔබගේ ඉලක්ක ජයගැනීම සඳහා ඔබට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) පාසල් ගීය ගායනා කරනු ලබන අවස්ථා දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(iv) රෝහලක කාර්ය මණ්ඩලයට අයත් නිල තනතුරු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(v) ඔබ ජීවත්වන පළාත හා දිස්ත්‍රික්කය නම් කරන්න. (ලකුණු 02)

(vi) ඔබ ප්‍රදේශයේ ඇති සමිති දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(vii) ජල නාස්තිය වලක්වා ගැනීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(viii) හොඳින් අධ්‍යාපන කටයුතුවල යෙදීම නිසා ඔබට ලැබෙන ප්‍රතිඵල දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

02. (i) ඔබේ පාසල් සංවිධාන ව්‍යුහයේ සාමාජිකයන් (තනතුරු) දෙදෙනෙකු සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පාසලක පවතින පොදු නීති දෙකක් හා සම්ප්‍රදායයන් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) රජය මගින් ඔබගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා සපයන පහසුකම් දෙකක් සඳහන් කර ඒවා භුක්ති විඳින ඔබ විසින් ඉටුකළ යුතු යුතුකම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)


03. (i) පහත දක්වෙන පරිසර සම්පත් භාවිතාකර මිනිසා විසින් නිර්මාණය කරන ලද සම්පත් දෙකක් සඳහන් කරන්න.

A - මැටි


B - දැව

(ලකුණු 02)


(ii) පහත A, B, C හා D රූප සටහන් වලින් දූෂණයට ලක්වන පරිසර අංගය කුමක්දැයි හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 04)




A



B



C



D

(iii) 'අපේ මව්බිම' නමින් ශ්‍රී ලාංකික අපට අභිමානවත් වියහැකි, දේශීය දේ අගයමින් වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 05)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(04) (i) ඔබේ නිවස අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම හා අංකය සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) භෞතික සම්පත් ලෙස හිරුඑළියෙන් හා වනාන්තරවලින් ලබාගන්නා ප්‍රයෝජන හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ඔබ ප්‍රදේශයේ පවතින ආගමික සිද්ධස්ථාන දෙකක් සඳහන් කර එම සිද්ධස්ථාන මගින් සිදුවන සේවාවන් තුනක් ලියා දක්වන්න. (ලකුණු 05)

(05) (i) ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පළාත් පාලන ආයතනයකින් ඉටුවන සේවාවන් හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) අපට සේවා සපයන ආයතනවල යුතුකම් පහක් ලියන්න. (ලකුණු 05)

(06) (i) ආචාරශීලීව භාෂාව හැසිරවිය යුතු අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ආචාරශීලී කථනයේ අංග ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) විනය හා ශික්ෂණය සඳහා පාසල තුළ පවත්වා ගතයුතු ජීවන පුරුදු පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

(07) (i) ඔබ ජීවත්වන ප්‍රදේශයේ මිනිසුන් සාමුහිකව කටයුතු කරන අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii)
- සිසුන්ගේ සෞඛ්‍ය පරීක්ෂා කිරීම
- බෝවන රෝග පාලනය
- ප්‍රදේශයේ අපරාධ වැලැක්වීම.
- රජයේ සහනාධාර බෙදීම.
- නීතිය හා සාමය ආරක්ෂා කිරීම.

ඉහත සේවාවන් අතරින් මහජන සෞඛ්‍ය පරීක්ෂක හා පොලිස් නිලධාරි විසින් ඉටුකරන සේවා දෙක බැගින් තෝරා ලියන්න. (ලකුණු 04)

(iii) ළමා සමාජයක් මගින් ක්‍රියාත්මක කරන වැඩසටහනක් චිත්‍රයට නඟන්න. (ලකුණු 05)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk